302

RARE

# ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිරීති පිළිබඳ ඓතිහාසික හා විචාර පූර්වක අධ්‍යයනයක්

ප්‍රවේශ අංකය 302
වර්ග අංකය

එච්.එම්. ටිකිරි බණ්ඩාර ගුණතිලක.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති දෑ අවුරුදු පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2004 ජනවාරි

# නිබන්ධ සාරාංශය.

මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිරීති පිළිබඳව ඓතිහාසික හා විචාර පූර්වක අධ්‍යයනයක් අරමුණු කර ගෙන සිදු වූවකි. ඒ අනුව ඓතිහාසික තොරතුරු අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ විෂය ආශ්‍රිතව ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් ඇත්තේ ඉතා දිගු ඉතිහාසයකි. මෙහි දී නීතිමය ක්ෂේත්‍රයේ තොරතුරු අනාවරණය වන්නේ වර්ෂ 1911 හඳුන්වා දුන් බ්‍රිතාන්‍ය රාජකීය ප්‍රකාශන අයිතිය පිළිබඳ පනත ලංකාවේ ද ක්‍රියාත්මක වීමෙන් අනතුරුව ය. වර්ෂ 1911 ට පෙර ලංකාවේ කිසියම් අයුරකින් සම්ප්‍රදායානු කූල හෝ රජවරුන් විසින් විශේෂ ප්‍රඥප්ති මඟින් හෝ ප්‍රකාශන අයිතිය තහවුරු කෙරෙන ක්‍රමයක් තිබුණේ ද යන්න ගැන මේ දක්වා කරුණු අධ්‍යයනය කර නොමැත. නමුත් මෙම අධ්‍යයනයෙන් වර්ෂ 1908 අංක 12 දරන පොත්පත් ආදිය පිළිබඳ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස පනවන ලද පනතක් සොයා ගැනීමට හැකිවිය. එය පස් වැනි පරිච්ඡේදය 5.2.2 උප පරිච්ඡේදයේ අන්තර්ගත වේ. එමෙන් ම වර්ෂ 1911 බ්‍රිතාන්‍ය ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ පනත ලංකාවේ ක්‍රියාත්මක වූයේ වර්ෂ 1912 ජූලි මස 01 වැනි දින සිටය. ඒ වූකලී ලංකාවේ ප්‍රකාශන අයිතිය පිළිබඳ අංක 20 දරන, වර්ෂ 1912 දී පැනවූ ආඥාව අනුව පැනවූවකි. එතැන් සිට ලංකාවේ පැවැති සාමාජික, ආර්ථික දේශපාලනමය සහ සංස්කෘතිකමය වාතාවරණය කිසිසේත් ම සැලකිල්ලට නොගෙන ක්‍රියාත්මක වූ මෙකී පනත් වරින් වර විවිධ සංශෝධනයන්ට භාජනය වී තිබේ. මේ අනුව වර්ෂ 1915 අංක 21 දරන සංශෝධනය, වර්ෂ 1918 අංක 11 දරන සංශෝධනය ද මෙම පනතට ඇතුළත් කිරීමට උත්සාහ දරන ලද නමුත් මෙම සංශෝධන දෙකම වර්ෂ 1919 අංක 6 දරන සංශෝධනයෙන් අහෝසි කර දමන ලදී. ඉන් අනතුරුව වර්ෂ 1936 දී බ්‍රිතාන්‍ය ප්‍රකාශන අයිතිය පිළිබඳ පනතේ 125 වැනි පරිච්ඡේදය ප්‍රකාශන අයිතිය යටතේ නීති රීති සම්පාදනය කරනු ලැබීය. මෙම නීතිරීති වූ කලී වර්ෂ 1911 රාජකීය ප්‍රකාශන අයිතිය පිළිබඳ පනතේ 14 වැනි ඡේදය යටතේ වර්ෂ 1919 ජූනි 2 වැනි දින ලංකාවේ රේගුවේ ප්‍රධාන අයකැමි විසින් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය පරිදි සකස් කරන ලද ඒවා වේ. වර්ෂ 1942 දී

2 වැනි ලෝක යුද්ධ සමයේ දී (හදිසි) සංශෝධන කීපයක් වර්ෂ 1942 අංක 32 දරන සංශෝධනය මගින් කරන ලදී. ඉන් පසු මෙම පනතේ නැවත සංස්කරණයක් කරනු ලැබුවේ වර්ෂ 1956 දීය. මෙම සංස්කරණය ලංකාවේ ප්‍රකාශන අයිතියට පටහැනි ලෙස ක්‍රියා කිරීමට එරෙහිව පිළියම් යෙදීම සඳහා ඇති කරන ලද්දකි. එය වර්ෂ 1911 පනතට ඒකාබද්ධ වන පරිදි පේටන්ට්, සැළසුම්, ප්‍රකාශන අයිතිය හා වෙළෙඳ ලකුණ යන සියලුම අංශ එකතු කොට වෙන ම නීති ප්‍රඥප්තියක් ලෙස සකස් කරනු ලැබුවකි. එය වූ කලී වර්ෂ 1911 පනතේ ම දීර්ඝ කිරීමක් ද විය. මේ සංශෝධනය අනුව ප්‍රකාශන අයිතිය පිළිබඳ බලධාරියා වූයේ පේටන්ට් ලකුණ හා වෙළෙඳ ලකුණ සම්බන්ධයෙන් පත් කරනු ලබන රෙජිස්ට්‍රාර්වරයෙකි. වර්ෂ 1979 දක්වා මෙම ප්‍රකාශන අයිතිය පිළිබඳව බ්‍රිතාන්‍ය පනත හා ඒ අනුව සකස් වූ ලංකා ප්‍රකාශන අයිතිය පිළිබඳ ආඥා පනත මගින් ලංකාවේ ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිමය කරුණු විග්‍රහ වූ නමුත් වර්ෂ 1979 අගෝස්තු 8 වැනි දින සම්මත කරනු ලැබූ අංක 52 දරන ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත මඟින් ඉහත සඳහන් වූ සියලුම පනත් අහෝසි කරනු ලැබූ අතර අලුත් නීතිරීති ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් පනවනු ලැබුණි. මෙම පනත ද වර්ෂ 1980 අංක 30 දරන සංශෝධනය, වර්ෂ 1983 අංක 2 දරන සංශෝධනය වර්ෂ 1990 අංක 17 දරන සංශෝධනය ලෙසත්, වර්ෂ 1997 අංක 13 දරන සංශෝධනය සහ වර්ෂ 2000 අංක 40 දරන සංශෝධනය, අනතුරුව එය වර්ෂ 2003 අප්‍රේල් මස 25 වැනිදා දාතමින් පනත් කෙටුම් පතක් ලෙස විවිධ අවස්ථාවලදී විවිධ කරුණු සම්බන්ධයෙන් සංශෝධනයන්ට ලක් විය. ඒ අනුව වර්ෂ 2003 අප්‍රේල් 25 දක්වාම ලංකාවේ ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් බලපැවැත් වූයේ මෙම පනත මඟින් ඇති කරනු ලැබූ නීතිරීතීන් ය. නමුත් වර්තමානයේ නව බුද්ධිමය දේපළ පනතක් ක්‍රියා ගතව පවතී.

එහෙත් මෙරට බුද්ධිමය දේපළ විෂය ආශ්‍රිත ප්‍රකාශන හිමිකම සම්බන්ධයෙන් මෙතෙක් පැන නැගී තිබුණු ගැටලු සඳහා උක්ත පනත් වලින් විසඳුම් ලැබූ බවක් දක්නට නොලැබේ. එමෙන් ම නව බුද්ධිමය දේපළ පනතක් හඳුන්වා දී ඇති මේ අවස්ථාවේ දී එකී කටයුත්තේ ඇති වගකීම බරපතල ලෙස

තේරුම් ගැනීමේ අවශ්‍යතාව මෙයින් ඉස්මතු කරයි. ඒ අනුව උක්ත පනත් සහ ඊට තදනන්තරව බලපෑ පනත් බොහෝමයක් අන්තර් විශ්ලේෂණයකට මෙහි දී භාජනය කරන ලදී. ඒ තුළින් ශ්‍රී ලංකාවේ මෙතෙක් ක්‍රියාගත වන බුද්ධිමය දේපළ විෂය ආශ්‍රිත ප්‍රකාශන අයිතියට අදාළ නෛතික සහ ප්‍රායෝගිකත්වය මෙම පර්යේෂණයෙන් විග්‍රහ කර ඇත. විශේෂයෙන්ම පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයානු බද්ධව බුද්ධිමය දේපළ ආශ්‍රිත ප්‍රකාශන හිමිකම සාකච්ඡා කරන්නේ ද, එහි ඇති නෛතික ස්වරූපය හා ප්‍රායෝගික භාවිත ලක්ෂණ අතර ඇති සම්බන්ධතාවය නිසාමය. මෙය තරමක් සංකීර්ණ ය. එකී ස්වරූපයන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ බලපාන අකාරය මෙම පර්යේෂණයෙන් අනාවරණය කර ඇත.

බුද්ධිමය දේපළ ආශ්‍රිත ප්‍රකාශන හිමිකම, ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන විට පැන නගින්නා වූ ගැටලු රාශියක් තිබේ. එකී ගැටලු සඳහා රැකවරණය ලබා දෙනු වස් අධ්‍යයනයෙන් විග්‍රහ කෙරෙන තත්ත්වයන් විසඳුම් වනු ඇත. එහෙත් නෛතිකත්වය හා ප්‍රායෝගිකත්වය යථාර්ථවාදීව සිදුවන බවක් මෙම අධ්‍යයනයේ දී හඳුනාගත නො හැකි විය. මෙම ස්වරූපයන් අධ්‍යයනය කිරීම වූ කලී මෙම පර්යේෂණයේ ප්‍රතිඵලයයි. ඒ අනුව එදා මෙදා තුර ක්‍රියා ගතව පැවති බුද්ධිමය දේපළ විෂය ආශ්‍රිත ප්‍රකාශන හිමිකම් පනත් මෙරට බුද්ධිමය දේපළ හිමිකම් ආරක්ෂණයේ දී දරන ලද දායකත්වය ප්‍රසංශනීය ය. අඩුපාඩු මධ්‍යයේ වුව ද සිය කාර්යභාරය එකී පනත් විසින් ඉටු කොට තිබේ. නමුත් පසු කාලීනව වෙනස් වූ බුද්ධිමය දේපළ විෂයට ඉතා ප්‍රායෝගික නීති රීති මාලාවක් හඳුන්වා දුන් බවක් මෙම අධ්‍යයනයේ දී හඳුනා ගැනීමට නොහැකි විය. එය වර්ෂ 2003 නව බුද්ධිමය දේපළ පනතේ ඇතැම් වගන්තිවලට විරුද්ධව නඩු මාර්ගයට යෑම සනාථ කරයි. නමුත් මෙම පනත 21 වැනි සියවසේ ලාංකිකයාගේ බුද්ධිමය දේපළ සුරක්ෂිත භාවය සඳහා ගන්නා ලද හොඳ උත්සාහයකි. විශේෂයෙන් ම තොරතුරු තාක්ෂණය අලලා දක්වන ලද වගන්ති අදට ඉතා අත්‍යවශ්‍ය වූවකි. ඒ අනුව බුද්ධිමය දේපළ විෂය ආශ්‍රිතව ඓතිහාසික තොරතුරු ගවේශනයත්, එය විචාර පූර්වකව අධ්‍යයනයට ලක් කිරීමත් මෙම පර්යේෂණයේ මූලික අභිප්‍රාය විය.